## ක්ෂුද්‍ර මූල්‍ය ණය

වාණිජ බැංකුවකින් ණය මුදලක් ලබා ගත නොහැකි, වත්කම් නොමැති, ඇපයක් ඉදිරිපත් කළ නොහැකි ජනතාවට තම හැකියාවෙන් සහ තම ශක්තියෙන් ස්වයං රැකියාවක් කොට තම ජීවිතය ජය ගැනීමට ඇපයක් හෝ ඇපකරුවකු නොමැතිව ණය ලබා ගත හැකි ක්‍රමවේදයක් හා මනා පාලනයකින් යුතුව කණ්ඩායම් ක්‍රමය තුළ ඉතා සාධාරණ පොළී අනුපාතයක් ඇතිව ණය ලබා දීම ‘ක්ෂුද්‍ර මූල්‍ය’ ණය ක්‍රමය යි.

## ක්ෂුද්‍ර මූල්‍ය ණය

ගිනි පොළීකරුවන්ගේ ග්‍රහණයෙන් දුගී ජනතාව මුදවාගෙන ඉතා සූක්ෂමව පසු විපරම් කරමින් එම ජනතාවගේ දැනුම, ධෛර්යය ශක්තිය සහ උනන්දුව තීව්‍ර කරමින් ජාතික සංවර්ධනයේ පුරුකක් බවට එම ජනතාව ශක්තිමත් කිරීම ක්ෂුද්‍ර ණය තුළ ගැබ්ව ඇති මූලික පදනම යි.



# ක්ෂුද්‍ර මූල්‍ය ණය

ණය ලබා දීම පමණක් නොව ශක්තිමත් ආර්ථික දියුණුවක් සඳහා සාමාජීය යුතුකම් මැනවින් වටහා ගැනීමට අවස්ථාව සැලසීම සඳහා තම ශක්තිය ජාතික සංවර්ධනය සඳහා දායක කර ගැනීමට මග පෑදීම 'ක්ෂුද්‍ර මූල්‍ය ණය' තුළ අන්තර්ගත දෙවන පරමාර්ථය යි